# ජයලත් මනෝරත්නගේ නාට්‍යයන්හි නිරූපිත පරිපීඩිත සමාජ පරිස්ථිතිය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්
## (මහගිරිදඹ, කණේරු මල්, බූරුවා මහත්තයා, සෙල්ලම් නිරිඳු නාට්‍ය ඇසුරින්)

එරංග කෞශල්‍ය ගොඩකන්ද ආරච්චි,
erangakaushalya92@gmail.com

**සාරසංක්ෂේපය**

අසූව දශකයේ දී නාට්‍ය නිෂ්පාදනයට පිවිසි මනෝරත්න, මෙරට නාට්‍ය කලාවේ උන්නතියට දායකත්වය ලබා දුන් නාට්‍යකරුවෙකි. ඔහු රචනා කළ ස්වතන්ත්‍ර නාට්‍ය සංඛ්‍යාව දොළොසකි. ඒ අතුරින් **මහගිරිදඹ** (1980), **කණේරු මල්** (2000), **බූරුවා මහත්තයා** (2011), **සෙල්ලම් නිරිඳු** (2013) සාර්ථක ලක්ෂණ ප්‍රකට කරන නාට්‍ය නිර්මාණ කිහිපයකි. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ ඉහත සඳහන් නාට්‍යයන්හි නිරූපිත පරිපීඩිත සමාජ පරිස්ථිතිය අධ්‍යයනය කිරීමයි. විවිධ සමාජ ස්තරවල ජනතාව පරිපීඩනයට ලක් වන ආකාරය මනෝරත්න නිරූපණය කර ඇති බව හඳුනා ගැනීමට හැකි වීම මෙම පර්යේෂණයේ වැදගත්කම යි. නාට්‍යකරුවා පරිපීඩිත සංකල්පය අර්ථ කථනය කරන ආකාරය හා උක්ත නාට්‍යවල කෙතෙක් දුරට පරිපීඩිත සමාජය නිරූපණය වන්නේ ද යන්න හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ මූලික ගැටලුව යි. පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය භාවිතයට ගැනුණි. ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් ජයලත් මනෝරත්න රචනා කළ **මහගිරිදඹ, කණේරු මල්, බූරුවා මහත්තයා, සෙල්ලම් නිරිඳු** යන නාට්‍යයන්හි පිටපත් භාවිත කෙරුණි. ද්විතීයික මූලාශ්‍රය වශයෙන් පරිපීඩිත සමාජය සම්බන්ධයෙන් රචනා වූ විවිධ ග්‍රන්ථ හා ජයලත් මනෝරත්නගේ නාට්‍ය සම්බන්ධයෙන් රචනා වූ විවිධ විචාර ලිපි භාවිතයට ගැනුණි. **මහගිරිදඹ** නාට්‍ය සඳහා විෂය වන්නේ තරුණ නාට්‍යකරුවෙකුට මුහුණ පෑමට සිදුවන සමාජ -. ආර්ථික පීඩනයයි. **කණේරු මල්** නාට්‍යයෙහි මෙරට ගොවි ජනතාව කායික ව හා මානසික ව පරිපීඩනයට ලක් වන ආකාරය නිරූපණය වේ. **බූරුවා මහත්තයා** නාට්‍යයේ දී කම්කරු ජනතාවත්, ඔවුන් වෙනුවෙන් පෙනී සිටින බලවේගයන්ට අත්වන ඛේදනීය ඉරණමත් නිරූපණය කෙරෙයි. **සෙල්ලම් නිරිඳු** නාට්‍යය සඳහා පසුබිම් වන්නේ ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රාජ්‍ය සමයයි. රජු විවාහ කර ගන්නා 'සුමිත්‍රා' නම් විජාතික කුමාරිකාව නුපුරුදු සංස්කෘතික වපසරියක පරිපීඩනයට ලක්වන ආකාරය නිරූපණය වේ. උක්ත නාට්‍ය නිර්මාණයන්හි චරිත සමාජ, සංස්කෘතික, ආර්ථික හා දේශපාලනික හේතු පදනම් කරගෙන පීඩනයට පාත්‍ර වූවෝය. පරිපීඩිතභාවයෙන් මිදීම සඳහා ඔවුහු මරණය තෝරා ගැනීම හෝ අරගල කිරීමට හෝ පෙලඹෙති. කායික හා මානසික පරිපීඩිතභාවය පන්ති පරතරයක් නොමැතිව පවතින ආකාරය මෙහි දී නිරූපණය කෙරෙයි. පරිපීඩිතභාවයෙන් වියුක්ත සාධාරණ සමාජයක වටිනාකම ඉදිරිපත් කිරීමට මනෝරත්න උත්සාහ කර ඇති ආකාරය මෙම පර්යේෂණය මගින් තහවුරු වෙයි.

**ප්‍රමුඛ පද:** නාට්‍ය, පරිපීඩනය, මනෝරත්න, සංස්කෘතිය, සමාජය

# Analytical Study of the Oppressed Social Circumstances Depicted by Plays of Jayalath Manoratne (Through plays: *Mahagiridamba, Kaneru Mal, Buruwa Mahattaya, Sellam Nirindu*)

Eranga Kaushalya Godakanda Arachchi
erangakaushalya92@gmail.com

**Abstract**

Mr Jayalath Manoratne, a playwright who had commenced his productions in the $80^{th}$ decade, made his contribution to upholding the drama industry. There are 12 plays which were solely composed by him, and out of those, *Mahagiridamba* (1980), *Kaneru Mal* (2000), *Buruwa Mahattaya* (2011) and *Sellam Nirindu* (2013) are a few plays which showed greater success traits. The objective of this research is to investigate the oppressed social circumstances depicted by the aforementioned plays. The research is significant as it distinguishes the approaches used by Manoratne to characterise the circumstances where different levels of society are oppressed. The main problem of this research focuses on identifying the playwright's definition of oppressed ideology and the extent to which the oppressed society is represented in aforesaid plays. Primary and secondary sources were used as the research methodology. The play scripts of *Mahagiridamba, Kaneru Mal, Buruwa Mahattaya* and *Sellam Nirindu* written by Jayalath Manoratne were used as primary sources while using few written sources related to the oppressed society and reviews related to Jayalath Manoratna's plays as secondary sources. Socio-economic difficulties faced by a young playwright is the subject matter of the play "*Mahagiridamba*" and the play "*Kaneru Mal*" signifies how the peasants of the country are oppressed mentally and physically. The tragic fate of labourers as well as their representative parties, are symbolised in "*Buruwa Mahattaya*" and the play "*Sellam Nirindu*" is based on the era of king *Sri Veera Parakrama Narendrasinghe*. This portrays how the foreign princess *Sumithra*, a queen of the king, is being oppressed because of her unfamiliar cultural background. The characters of the aforementioned plays had been oppressed for many reasons, such as social, cultural, economic and political. They tend to choose either death or struggle to get rid of the stress. This represents how physical and mental oppression rises despite the class gap. The attempt made by Jayalath Manoratne to illustrate the value of an unoppressed, fair society has been clearly identified by this research.

**Keywords:** Culture, Manoratne, Oppression, Society, Sri Veera Parakrama Narendrasinghe